# චතුත්ථො පාඨො

## භික්ඛු



සංසාරභයං ඉක්ඛතීති භික්ඛු. උදාහු භික්ඛතීති වා භික්ඛු. තථාගතසාවකස්ස එතං අධිවචනං. තෙ ඡින්නභින්නපටධරා මුණ්ඩකා සුපටිපන්නා ච භවන්ති. යෙ අගාරස්මා නික්ඛම්ම අනගාරියං පබ්බජිතා සංසාරදුක්ඛස්ස අන්තං පරියෙසමානා විචරන්ති, තෙ එව භික්ඛු හොන්ති. අනරියා සාසනෙ පබ්බජිතා භික්ඛාය ජීවිකං කප්පෙන්තා සමණපතිරූපකා ඉදානි ලොකෙ වසන්ති. තථා'පි තෙ භික්ඛූ'ති න මඤ්ඤන්ති. භික්ඛු පන ගිහීඔදාතවසනා විය න නිවාසනපාරුපනං කරොන්ති. තෙ කාසායානි වත්ථානි පරිදහන්ති. කෙසමස්සුං ඔහරන්ති. විකාලෙ න භුඤ්ජන්ති. බ්‍රහ්මචාරී'ව පණ්ණසාලනිවාසිනො ච භවන්ති. තෙ න ගිහීසංසට්ඨා.

(පාලි රචනා 2)

**පදමාලාව**

| | | |
|---|---|---|
| **සංසාරභයං** | - | සසර බිය |
| **ඉක්ඛති** | - | දකියි |
| **උදාහු** | - | නොහොත් |
| **භික්ඛති** | - | පිඬු සිඟයි |
| **එතං අධිවචනං** | - | මේ තවත් වචනයකි |
| **ඡින්නභින්නපටධරා** | - | සුන් බුන් වස්ත්‍ර දරන්නෝ |
| **මුණ්ඩකා** | - | හිසමුඩු කළාහු |
| **සුපටිපන්නා** | - | මනාව පිළිපන්නාහු |

| | | |
|---|---|---|
| අගාරස්මා | - | ගිහිගෙයින් |
| නික්ඛම්ම | - | නික්ම |
| අනගාරියං | - | අනගාරික වූ ශාසනයෙහි |
| පබ්බජිතා | - | පැවිදි වූවාහු |
| සංසාරදුක්ඛස්ස | - | සසර දුකේ |
| අන්තං | - | අවසානය |
| පරියෙසමානා | - | සොයන්නාහු |
| අනරියා | - | අනාර්යයෝ |
| ජීවිකං කප්පෙන්තා | - | ජීවිකාව කරන්නාහු |
| සමණපතිරූපකා | - | ශ්‍රමණ වේශධාරීහු |
| මඤ්ඤන්ති | - | සිතාගනිති |
| ගිහීඔදාතවසනා | - | ගිහි සුදු වස්ත්‍ර අඳින්නාහු |
| විය | - | මෙන් |
| නිවාසනපාරුපනං | - | වස්ත්‍ර පෙරවීම |
| කාසායානි වත්ථානි | - | කසාවත් |
| පරිදහන්ති | - | පෙරවති |
| කෙසමස්සු | - | කෙස් රැවුල් |
| ඔහරන්ති | - | ඉවත් කරති |
| විකාලෙ | - | නොකල්හි |
| පණ්ණසාලනිවාසිනො | - | පන්සලෙහි වසන්නෝ |
| ගිහීසංසට්ඨා | - | ගිහියන් හා ආශ්‍රය කරන්නෝ |

## අභ්‍යාස

කො - කවරෙක් ද  කිං - කුමක් ද  කෙ - කවරහු ද

**1. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.**

උදා:- **සමණපතිරූපකා කුහිං වසන්ති? සමණපතිරූපකා ලොකෙ වසන්ති.**

i. කො සංසාරභයං ඉක්ඛති ?
ii. කිං තථාගතසාවකස්ස අධිවචනං ?
iii. කෙ භික්ඛාය ජීවිකං කප්පෙන්ති ?
iv. කෙ විකාලෙ න භුඤ්ජන්ති ?
v. කෙ න ගිහීසංසට්ඨා ?

**2. පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.**

i. සංසාරභයං ................. භික්ඛු.
ii. භික්ඛු පන ..............................න නිවාසනපාරුපනං කරොන්ති.
iii. තෙ ........................ න භුඤ්ජන්ති.
iv. ...................... පණ්ණසාලනිවාසිනො ච භවන්ති.
v. ............................ න ගිහීසංසට්ඨා.

## නාම වරනැඟීම

විවිධාර්ථවත් ශබ්දයන් ඒකවචන බහුවචනවලට ද, පුල්ලිඞ්ග, ඉත්ථිලිඞ්ග, නපුංසකලිඞ්ගවලට ද, පඨමා, දුතියා ආදී විභක්තිවලට ද සුදුසු ලෙස යොදා පෙන්වීම 'නාම වරනැඟීම' නම් වේ.

**ශබ්දාන්ත වශයෙන් නාම වෙනස් වන ආකාරය හඳුනාගනිමු.**

භාෂාවක ඇති සියලු ශබ්ද 'ස්වරාන්ත' සහ 'හලන්ත' වශයෙන් කොටස් දෙකකට බෙදේ. එසේ වුවත් පාලි භාෂාවේ ඇත්තේ 'ස්වරාන්ත ශබ්ද' පමණකි. ශබ්දයක් කුමන අන්තයකට අයත් දැයි හඳුනාගන්නේ ශබ්දයේ අග ඇති ස්වරයෙනි. ශබ්දයේ අග අ **කාරාන්ත, ආ කාරාන්ත, ඉ කාරාන්ත, ඊ කාරාන්ත, උ කාරාන්ත, ඌ කාරාන්ත, ඔ කාරාන්ත** වශයෙන් අන්තඃස්වර ඇති හෙයින් එම ශබ්ද 'ස්වරාන්ත ශබ්ද' නමින් හැඳින්වේ. පාලි භාෂාවේ එ කාරාන්ත ශබ්ද දකින්නට නැත. ස්වරාන්ත ශබ්ද කිහිපයක් පහත දැක්වේ.

අ කාරාන්ත - **දෙව, අත්ත, රාජ, චිත්ත, මන, ඵල**
ආ කාරාන්ත - **කඤ්ඤා, සද්ධා, මෙධා, සා**
ඉ කාරාන්ත - **අග්ගි, ආදි, රත්ති, අට්ඨි, මුනි, ඉසි**
ඊ කාරාන්ත - **දණ්ඩී, නදී**
උ කාරාන්ත - **භික්ඛු, ජන්තු, සත්ථු, නත්තු, පිතු, යාගු, ගුරු, මාතු**
ඌ කාරාන්ත - **අභිභූ, සබ්බඤ්ඤූ**
ඔ කාරාන්ත - **ගො**

## නාම විභක්ති ප්‍රත්‍යය

ශබ්දප්‍රකෘතියට පසුව යෙදී ඒකවචන බහුවචන භේදයත් පඨමා, දුතියා ආදි විභක්ති භේදයත් ප්‍රකාශ කරනුයේ නාමවිභක්ති ප්‍රත්‍යය මගිනි. ශබ්දප්‍රකෘතිය පඨමා, ආලපන, දුතියා ආදි වශයෙන් සහ ඒකවචන බහුවචන වශයෙන් බෙදන නිසා එවා **'විභක්ති'** නමින් හැඳින්වේ. පාලි භාෂාවේ නාම විභක්ති නවයක් සහ ප්‍රත්‍යය 14 ක් දක්නට ලැබේ. ඒවා මෙසේ ය.

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **පඨමා** | සි | යො |
| **දුතියා** | අං | යො |
| **තතියා** | නා | හි |
| **චතුත්ථී** | ස | නං |
| **පඤ්චමී** | ස්මා | හි |
| **ඡට්ඨී** | ස | නං |
| **සත්තමී** | ස්මිං | සු |

මෙම වගුවේ ආලපන සහ කරණ විභක්තිය සඳහන් නොවන්නේ ආලපන විභක්තිය පඨමා විභක්තියේ ප්‍රත්‍යයක් හා කරණ විභක්තිය තතියා විභක්තියේ ප්‍රත්‍යයක් වශයෙන් යෙදෙන හෙයිනි.

## වචන භේදය

නාමපද ඒකවචන හා බහුවචන වශයෙන් දෙයාකාර වේ. එක් අයෙක් හෝ දෙයක් ගැන කියවෙන විට ඒකවචන ලෙසත් ඊට වඩා වැඩි පිරිසක් ගැන කියවෙන විට බහුවචන ලෙසත් භාවිත වේ.

| **ඒකවචන** | **බහුවචන** |
|---|---|
| දෙවො | දෙවා |
| කඤ්ඤා | කඤ්ඤායො |
| භික්ඛු | භික්ඛවො |
| මුනි | මුනයො |
| භානු | භානවො |

පාලි භාෂාව නිවැරැදි ව තේරුම් ගැනීමට නම් ඒ ඒ විභක්ත්‍යාර්ථ පිළිබඳ දැනුවත් විය යුතු ය. ඒ සඳහා පුරුෂ ලිංගයට (පුල්ලිංග) අයත් වන පහත දැක්වෙන අකාරාන්ත **දෙව**, ඉකාරාන්ත **අග්ගි**, උකාරාන්ත **භික්ඛු** ශබ්ද අර්ථ සහිත ව හදාරමු.

**අකාරාන්ත පුලලිංග 'දෙව' ශබ්දය**

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | දෙවො | දෙවා |
| ආලපන | (හෙ)දෙව, දෙවා | (භවන්තො) දෙවා |
| දුතියා | දෙවං | දෙවෙ |
| තතියා | දෙවෙන | දෙවෙභි, දෙවෙහි |
| කරණ | දෙවෙන | දෙවෙභි, දෙවෙහි |
| චතුත්ථී | දෙවාය, දෙවස්ස | දෙවානං |
| පඤ්චමී | දෙවා, දෙවම්හා, දෙවස්මා | දෙවෙභි, දෙවෙහි |
| ඡට්ඨී | දෙවස්ස | දෙවානං |
| සත්තමී | දෙවෙ, දෙවම්හි, දෙවස්මිං | දෙවෙසු |

**කටපාඩම් කිරීමට**

එවං සුරාසුරනරොරගනාගයක්ඛා
ගන්ධබ්බකින්නරමනුස්සපිසාචපෙතා
මාතඞ්ගජඞ්ගමතුරඞ්ගවරාහසීහා
ව්‍යග්ඝච්ඡකච්ඡපතරච්ඡමිගස්සසොණා

ආලොකලොකනිලයානිලචාගයොග
වායාමගාමනිගමාගමධම්මකාමා
සඞ්ඝොඝඝොසපටිඝාසචකොධලොභ
සාරම්භථම්භමදමානපමාදමක්ඛා

පුන්නාගපූගපනසාසනචම්පකම්බ
හින්තාලතාලවකුලජ්ජුනකිංසුකා ච
මන්දාරකුන්දපුචිමන්දකරඤ්ජරුක්ඛා
ඡන්දයා මයූරසකුණණ්ඩජකොඤ්චහංසා

දෙව ශබ්දයට සමානව වරනැගෙන නාම කිහිපයක්

| | | | | | |
|---|---|---|---|---|---|
| සුර | - දෙවියා | අසුර | - අසුරයා | නර | - මිනිසා |
| උරග | - උරගයා | නාග | - නාගයා | යක්ඛ | - යක්ෂයා |
| ගන්ධබ්බ | - ගාන්ධර්වයා | කින්නර | - කිඳුරා | මනුස්ස | - මිනිසා |
| පිසාච | - පිසාචයා | පෙත | - ප්‍රේතයා | මාතඞ්ග | - ඇතා |
| තුරඞ්ග | - අශ්වයා | වරාහ | - ඌරා | සීහ | - සිංහයා |
| ව්‍යග්ඝ | - ව්‍යාඝ්‍රයා | අච්ඡ | - වලසා | කච්ඡප | - කැස්බෑවා |
| තරච්ඡ | - කළු වලහා | මිග | - මුවා | අස්ස | - අශ්වයා |

## අකාරාන්ත පුල්ලිංග 'දෙව' ශබ්දයේ අර්ථය

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | දෙවියා | දෙවියෝ |
| ආලපන | පින්වත් දෙවිය | පින්වත් දෙවියනි |
| දුතියා | දෙවියා | දෙවියන් |
| තතියා | දෙවියා විසින් | දෙවියන් විසින් |
| කරණ | දෙවියා කරණකොට ගෙන | දෙවියන් කරණකොට ගෙන |
| චතුත්ථී | දෙවියාට | දෙවියන්ට |
| පඤ්චමී | දෙවියා කෙරෙන් | දෙවියන් කෙරෙන් |
| ඡට්ඨී | දෙවියාගේ | දෙවියන්ගේ |
| සත්තමී | දෙවියා කෙරෙහි | දෙවියන් කෙරෙහි |

### ඉකාරාන්ත පුලලිංග 'අග්ගි' ශබ්දය

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | අග්ගි | අග්ගී, අග්ගයො |
| ආලපන | (හෙ) අග්ගි | (භවන්තො) අග්ගී, අග්ගයො |
| දුතියා | අග්ගිං | අග්ගී, අග්ගයො |
| තතියා | අග්ගිනා | අග්ගීභි, අග්ගීහි |
| කරණ | අග්ගිනා | අග්ගීභි, අග්ගීහි |
| චතුත්ථි | අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| පඤ්චමී | අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා | අග්ගීභි, අග්ගීහි |
| ඡට්ඨී | අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| සත්තමී | අග්ගිම්හි, අග්ගිස්මිං | අග්ගිසු, අග්ගීසු |

### කටපාඩම් කිරීමට

ජොති පාණි ගණ්ඨි මුට්ඨි
කුච්ඡි වත්ථි සාලි වීහි
ව්‍යාධි ඔධි බොධි සන්ධි
රාසි කෙසි සාති දීපි

ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි කපි
අසි මසි නිධි විධි අහි කිමි පති හරි
අරි තිමි කලි බලි ජලනිධි ගහපති
උරුධිති වරමති නිරුපධි අධිපති

'අග්ගි' ශබ්දයට සමානව වරනැගෙන ශබ්ද කිහිපයක්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පාණි | - | අත | ගණ්ඨි | - | ගැටය | මුට්ඨි | - | මිට |
| කුච්ඡි | - | කුස | වීහි | - | වී | ව්‍යාධි | - | ව්‍යාධිය |
| බොධි | - | බෝ ගස | දීපි | - | දිවියා | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ඉසි** | - ඉසිවරයා | **මුනි** | - මුනිවරයා | **මණි** | - මැණික |
| **ගිරි** | - පර්වතය | **රවි** | - සූර්යයා | **කවි** | - පණ්ඩිතයා |
| **කපි** | - වඳුරා | **අසි** | - කඩුව | **නිධි** | - නිධානය |
| **අහි** | - සර්පයා | **කිමි** | - පණුවා | **පති** | - ස්වාමියා |
| **අරි** | - සතුරා | **ජලනිධි** | - සාගරය | **ගහපති** | - ගෘහපතියා |

## උකාරාන්ත පුලලිංග 'භික්ඛු' ශබ්දය

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **පඨමා** | භික්ඛු | භික්ඛූ, භික්ඛවො |
| **ආලපන** | (හෙ) භික්ඛු | (භවන්තො) භික්ඛූ, භික්ඛවෙ, භික්ඛවො |
| **දුතියා** | භික්ඛුං | භික්ඛූ, භික්ඛවො |
| **තතියා** | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| **කරණ** | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| **චතුත්ථි** | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| **පඤ්චමී** | භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා | භික්ඛූහි, භික්ඛූභි |
| **ඡට්ඨී** | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| **සත්තමී** | භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛූසු, භික්ඛුසු |

**භික්ඛු ශබ්දයට සමානව වරනැගෙන ශබ්ද කිහිපයක්**

| | | | | | |
|---|---|---|---|---|---|
| **සෙතු** | - | හේදණ්ඩ | **කෙතු** | - | කොඩිය |
| **රාහු** | - | රාහුය | **භානු** | - | හිරු |
| **උච්ඡු** | - | උක්ගස | **වෙළු** | - | උණගස |
| **මච්චු** | - | මරණය | **මධු** | - | මීපැණි |
| **සින්ධු** | - | සාගරය | **බන්ධු** | - | නෑයා |
| **හෙතු** | - | හේතුව | **පටු** | - | දක්ෂයා |

### උකාරාන්ත පුල්ලිංග 'භික්ඛු' ශබ්දයේ අර්ථය

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | භික්ෂුව | භික්ෂූහු |
| ආලපන | පින්වත් භික්ෂුව | පින්වත් භික්ෂූනි |
| දුතියා | භික්ෂුව | භික්ෂූන් |
| තතියා | භික්ෂුව විසින් | භික්ෂූන් විසින් |
| කරණ | භික්ෂුව කරණ කොට | භික්ෂූන් කරණ කොට |
| චතුත්ථී | භික්ෂුවට | භික්ෂූන්ට |
| පඤ්චමී | භික්ෂුව කෙරෙන් | භික්ෂූන් කෙරෙන් |
| ඡට්ඨී | භික්ෂුවගේ | භික්ෂූන්ගේ |
| සත්තමී | භික්ෂුව කෙරෙහි | භික්ෂූන් කෙරෙහි |

**කටපාඩම් කිරීමට**

එවං සෙතු කෙතු භානු රාහු සඞ්කු උච්ඡු වෙළු
මච්චු මධු සින්ධු බන්ධු නෙරු මෙරු සත්තු
කාරු හෙතු ජන්තු රුරු පටු

## අභ්‍යාස

1. 'භික්ඛු' පාලි පාඨය සිංහලට නඟන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. නාම වරනැඟීම යනු කුමක්ද ?
ii. ස්වරාන්ත ශබ්ද පහක් නම් කරන්න.
iii. ස්වරාන්ත ශබ්දයක් හඳුනාගන්නේ කෙසේ ද?
iv. ස්වරාන්ත ශබ්ද වර්ග කර දක්වන්න.
v. නාම විභක්ති නවය ලියා දක්වන්න
vi. පාලි භාෂාවේ නාම විභක්ති සහ ප්‍රත්‍යය ලියන්න.
vii. ආලපන සහ කරණ විභක්ති සඳහා ප්‍රත්‍යය සඳහන් නොවන්නේ ඇයි?
viii. ඒකවචන නාමපද දහයක් ලියා ඒවා බහුවචනයට හරවන්න.
ix. පුරිස, කපි, සෙතු යන ශබ්ද සියලු විභක්තිවල වරනඟන්න.
x. කෙරෙන් හෝ ගෙන් යන අර්ථය ලැබෙන්නේ කවර විභක්තිය යෙදීමෙන්ද?

3. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. බුද්ධා ධම්මං දෙසති.
ii. සංඝො ගාමං ගච්ඡති.
iii. මනුස්සා සුරියං පස්සන්ති.
iv. වාණිජො ගාමෙ චරති.
v. ගොණා පාසාණෙ තිට්ඨන්ති.
vi. සකුණො රුක්ඛෙ නිසීදති.
vii. භූපාලා අස්සෙ ආරුහන්ති.
viii. අහං දීපං ආහරාමි.
ix. මයං ගොණෙ හරාම.
x. මයං ලොකෙ වසාම.

4. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. සුමේධ පහන ගෙන යයි.
ii. ඔහු පාඩම සිතයි.
iii. රජ සිංහයකු බලයි.
iv. එළුවෝ ගමෙහි හැසිරෙති.
v. කුරුල්ලා අහසේ පියාඹයි.
vi. සඳ කන්දෙන් උදාවෙයි.
vii. දෙවියා අහසෙන් යයි.
viii. මම ලෝකයෙහි වසමි.
ix. මම හිරු දකිමි.
x. අපි දූපතක වසමු.

පරිප්ලවපසාදස්ස, පඤ්ඤා න පරිපූරති

**ඉපිලෙන සැදැහැ ඇත්තාට ප්‍රඥාව නො වැඩේ.**

(ධම්මපදපාළි, චිත්තවග්ග, 6 ගාථාව)